www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සොල්දාදුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයෝ ලෝක සමාජවාදී වෙබ් අඩවියට කතා කරති

## Sri Lankan soldiers and their families speak to the WSWS

**අපගේ වාර්තාකරුවන් විසිනි**
**2008 නොවැම්බර් 28**

උතුරු ශ්‍රී ලංකාවේ දී මෑත සති ගනනාව තුල හමුදාව සහ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර පැවති දරුනු සටන්, දෙපාර්ශ්වයේ ම, සිය ගනනක නොවේ නම්, දුසිම් ගනනක මරනවලටත් ඊටත් වැඩි සංඛ්‍යාවක් තුවාල ලැබීමටත් තුඩු දී ඇත.

වත්මන් මිලිටරි ආක්‍රමනික මෙහෙයුම් කේන්ද්‍ර කොට ඇත්තේ උතුරේ වන්නි කලාපය තුල එල්ටීටීඊයේ මිලිටරි හා පරිපාලන මූලස්ථානය වන කිලිනොච්චිය අල්ලා ගැනීම මතය. එල්ටීටීඊ නායක වේලුපිල්ලෙයි ප්‍රභාකරන්ගේ ඊයේ වාර්ෂික "මහා වීර දින" කතාවට පෙර නගරය අල්ලා ගැනීම ශ්‍රී ලංකා ආන්ඩුවේ අභිප්‍රාය විය.

එහි ප්‍රතිඵලයක් ලෙස ජීවිත හානිය ඉහල අගයක් ගෙන තිබේ. මෝටාර් හා කාලතුවක්කු ප්‍රහාර ඇතුලත් දින තුනක තියුනු සටන්වලින් පසුව, කැරලිකරුවන් 122ක් මරා දමා සොල්දාදුවන් 27කගේ ජීවිත අහිමි වී ඇතැයි මිලිටරිය කියාපෑවේය. දෙපාර්ශ්වය ම ජීවිත හානි පිලිබඳ සාවද්‍ය සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීම වතාවතක් ලෙස කරති.

ප්‍රභාකරන් සිය කතාවේ දී, වත්මන් මිලිටරි ආක්‍රමනික මෙහෙයුම් "අලුත් දෙයක් වත් දැවැන්ත දෙයක් වත් නොවන්" බව ප්‍රකාශ කොට සාම සාකච්ඡා යලි ආරම්භ කිරීමට කැමැත්ත පල කලේය. කෙසේ වෙතත්, පුරසාරම් තිබිය දී ම, ජනාධිපති මහින්ද රාජපක්ෂ 2006 මැද දී දිවයිනේ සිවිල් යුද්ධය යලි ඇරඹූ තැන් පටන් එල්ටීටීඊය සැලකිය යුතු හානිවලට මුහුන දී තිබේ. එල්ටීටීඊයට නැගෙනහිර පිහිටි ඔවුන්ගේ සියලු බල මධ්‍යස්ථාන ද වන්නියේ සිය භූමි ප්‍රදේශවලින් අඩක් පමන ද අහිමි වී ඇත. පසුගිය දෙසතිය තුල දී, හමුදාව මූලෝපායිකව වැදගත් නගර දෙකක් -- පූනරින් සහ මාන්කුලම් -- අල්ලා ගෙන දැන් තුන් පැත්තකින් කිලිනොච්චිය දෙසට ගමන් කරයි.

රාජපක්ෂ වර්ගවාදී යුද්ධය යලි ඇරඹීමත් සමග ම, ආන්ඩුව පිලිබඳ මොන යම් හෝ විවේචනයක් නිහඬ කර දැමීමේ එල්ලයෙන් යුක්ත බියගැන්වීමේ ව්‍යාපාරයක් ද ක්‍රියාත්මක වී තිබේ. යුද කලාපයේ සිට කෙරෙන ස්වාධීන වාර්තාකරනයකට අවසර දී නැත. දේශහිතෛෂී හැඟීම් අවුලුවාලීමේ ආන්ඩුවේ ප්‍රයත්නයන්ගේ එල්ලය වන්නේ, යුද්ධයත් එහි ආර්ථික බරත් සම්බන්ධයෙන් පවත්නා පුලුලුව පැතිරුනු අසන්තෘප්තියේ -- මිලිටරියේ පහල සාමාජිකත්වය ද ඇතුලුව -- ගෙල හිර කර දැමීමයි.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ)* වාර්තාකරුවෝ, පසුගිය දෙසතිය තුල දී යුද්ධයත් එහි බලපෑමත් පිලිබඳව සොල්දාදුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ගනනාවකට කතා කලහ. මිලිටරියෙන් ද එය සහයෝගී ස්වොත්තමවාදී මැරයන්ගෙන් ද එල්ල විය හැකි දඩයමකින් හෝ පලිගැනීමකින් ඔවුන් ආරක්ෂා කරනු වස් ඔවුන්ගේ නම් පල කිරීමෙන් වලකිමු.

හමුදාවේ ජීවිත හානි පිලිබඳ සැබෑ සංඛ්‍යා ආන්ඩුව හෝ මිලිටරි ප්‍රකාශකයන් පිලිගන්නා මට්ටම්වලට වඩා බෙහෙවින් වැඩි වීමට ඉඩ ඇත. රෝහල් හතරක -- ජාතික රෝහල, හමුදා රෝහලක සහ දකුනු කොලඹ සහ ජයවර්ධනපුර රෝහල් -- සිටින සිය මූලාශ්‍රයන් වෙතින් ලෝසවෙඅ සොයා ගත් පරිදි, එම රෝහල්වල පිලිවෙලින් තුවාල ලැබූ සොල්දාදුවන් 200, 400, 60 හා 200 පමන සිටී. මෙම රෝහල් කොලඹ අගනුවර තුල හා ඒ අවට පිහිටි ඒවාය.

එක රෝහලක සොල්දාදුවන් 20ක් සිටිනු අප වාර්තාකරුවෝ දුටුවහ. ඔවුන්ගෙන් සමහරෙකුට සිය පාද අහිමිව තිබුනි. තවත් අයට දෑත් අහිමිව තිබුනි. සමහරු සිය පෙනීම ද තවත් අය කන් ඇසීම ද අහිමිව සිටියහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කිලිනොච්චි අල්ලා ගැනීමේ සටනේ නිමග්නව සිටි අය ය. බොහෝ දෙනෙක් කතා කිරීමට මැලි වූ නමුත් එක් සොල්දාදුවෙක් සටන්වල රුදුරු ස්වභාවය පිලිබඳව යම් දර්ශකයක් සම්පාදනය කලේය.

"යුද්ධයේ අවසානය මොකක් වේවිද කියලා කියන්න අපට බැහැ. එල්ටීටීඊ එක දුර්වල වෙලා. ඒ වුනත් ඒගොල්ලන්ට තවමත් පහර දෙන්න පුලුවන්. (සොල්දාදුවන්) කන්ඩායමක් අපි දිහාට හිනාවේගෙන ආවා. අපි හිතුවා ඒ අය අපේ කට්ටිය කියලා. ඒ වුනත් හදිසියෙම ඒ අය අපට පහර දුන්නා. අපේ අය ගනනාවක් ම මැරුනා. තුවලා වුනු අය අතරෙ මාත්

හිටියා. බොහෝ දෙනෙක් මැරේවි නැත්නම් තුවාල ලබාවි. ගොඩක් අය අංගවිකල පෝලිමට එකතු වේවි. ˝ යයි ඔහු *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසීය.

අපේ වාර්තාකරුවෝ බන්ඩාරවෙල අසල ජීවත් වූ මිය ගිය සොල්දාදුවකුගේ පවුලේ සාමාජිකයකුට කතා කලහ. පසුගිය මස මුල දී සටනක දී ඔහු මරුමුවට පත් වන විට ඔහු යන්තම් 21 වන වියට එළඹ තිබුනා පමනි. බොහෝ සොල්දාදුවෝ ආර්ථික හේතු මත හමුදාවට බැඳුනු අය ය -- එනම්, රැකියා හා අධ්‍යාපන අවස්ථා නැතිකම හේතු කොට ගෙන මිලිටරියට බැඳී ඇති බොහෝ සෙයින් ග්‍රාමීය සිංහල ප්‍රදේශවලින් පැමිනි තරුනතරුනියෝ ය.

මිය ගිය සොල්දාදුවා පවුලේ එකම පුත්‍රයා වූ අතර ඔහුට බාල සොහොයුරියන් දෙදෙනෙක් සිටියහ. එක් අයෙක් විවාහක වන අතර අනෙක් නැගනිය තවමත් 10 වන ශ්‍රේනියේ අධ්‍යාපනය ලබයි. ඔහුගේ පියාට හෘදයාබාධයක් වැලඳුනු නමුත් පවුලේ ආර්ථික දුෂ්කරතා නිසා රියදුරකු ලෙස වැඩ කරයි. තමා සිය පුතා හමුදාවට බැඳීම ගැන එකග වූයේ දෙගිඩියාවෙන් බව සොල්දාදුවාගේ මව පැහැදිලි කලාය. ඔහු ඇයට මෙසේ පැවසූ බව ඇය කීවාය: ˝දුක් වෙන්න එපා අම්මා. අපිව කෙලින් ම යුද්ධයට යවන්නෙ නැහැ.˝

˝හමුදාවේ නිලධාරීන් කීප දෙනෙක් ඇවිල්ලා ෆෝර්ම් කොල ගනනාවකට අත්සන් කරන්න කියලා අපිට කීවා. මගේ පුතා පුහුනුව ඉවර කරලා පාස් අවුට් වුනේ ජුලි 5 දා. එයා ක්‍රියාන්විතයට සම්බන්ධ වෙලා හිටියෙ මාස කිහිපයක් විතරයි. දැන් අපේ දරුවා නැති වුනේ මේ යුද්ධය නිසා. එයාගේ පඩිය ගෙවන්න ඒ ගොල්ල පොරොන්දු වුනත් කිසි දෙයක් වෙලා නැහැ. මරනෙ වැඩ කර ගන්න රුපියල් 100,000ක් අපට ලැබුනා.

˝මේ ඔක්කොම වුනේ අපේ දුප්පත්කම නිසා. මගේ මහත්තය හම්බ කරපු දේවල්වලින් අපට පුලුවන් වුනේ මේ ගෙදර කාමර දෙකක් හදාගන්න විතරයි. දැන් අපි මොනවද කරන්නෙ? මගේ පුතා අපට කිව්වා එයාගෙ පඩියෙන් ලබන ජනවාරියෙ ඉඳල ගේ හදන්න පටන් ගන්න පුලුවන් කියලා. එයා හමුදාවට බැඳුනෙ නැත්නම්, කොහොම හරි අපට ගේ හදාගන්න තිබුනා. එයා නැතිව අපි කොහොම ජීවත් වෙන්නද කියලා අපි දන්නෙ නැහැ.˝

අසල්වැසියෙක් ආන්ඩුව හා යුද්ධය සම්බන්ධයෙන් ඔහුට පවතින වෛරය මෙසේ සාරාංශගත කලේය: ˝යුද්දෙ තියෙන්නෙ ඒගොල්ලන්ගෙ පැවැත්මට. නැගෙනහිර මොකක්ද සිද්ධ වෙලා තියෙන්නෙ? දැන් ඒක පිල්ලෙයාන්ට දීලා˝ හමුදාව නැගෙනහිර පලාත ˝මුදාගැනීමෙන්˝ පසුව, ආන්ඩුව, පිල්ලෙයාන් නමින් ද ප්‍රසිද්ධ, කුප්‍රකට පැරා-මිලිටරි කන්ඩායමක නායකයා වන, එස්. චන්ද්‍රකාන්තන් මහ ඇමති ලෙස පිහිටුවීය.

මේ මාසයේ දී උතුරේ කිලාලිහි දී මරුමුවට පත් වූ අම්බලන්ගොඩ ප්‍රදේශයේ තරුන සොල්දාදුවකුගේ පවුලේ සාමාජිකයන්ට ද *ලෝසවෙඅ* වාර්තාකරුවෝ කතා කලහ. 2004 මැද දී හමුදාවට බැඳුනු ඔහු ඒ වන විටත් එක් වරක් තුවාල ලබා තිබුනි. ඔහු මිය ගියේ නිවස බලා එන බවට පොරොන්දු වී සිටි දිනයේ දී ම ය. ඔහුගේ මවගේ හද කඩා වැටුනි. ˝මම කොහොමද මේ දුක උහුලන්නෙ?˝ ඇය වැලපුනාය.

තම පුතා සමග සොල්දාදුවන් අටක් ඝාතනයට ලක් වූ බව ඔහුගේ පියා පැවසීය. ආරක්ෂක හමුදාවේ සේවය කරන ඔහුගේ සොහොයුරා කියා සිටියේ අවමඟුලට සහභාගි වීම පිනිස තමාට දින 10ක නිවාඩුවක් ලැබුනු බවයි. තමා උතුරේ සිට පැමිනි ගුවන් යානයේ තුවාල ලැබූ සොල්දාදුවන් 20ක් ද මල සිරුරු දෙකක් ද රැගෙන ආ බව ඔහු පැවසීය. උතුරේ යාපන අර්ධද්වීපයේ පලාලි ගුවන් තොටුපලේ සිට කොලඹට දිනපතා තුවලා ලැබූ සොල්දාදුවන් සහ මල සිරුරු ගුවනින් ගෙන එනු ලැබේ.

එය දුප්පත් පවුලකි. ඔහුගේ පියා වඩු කාර්මිකයෙකි. එහෙත් ඇස් පෙනීම දුර්වල නිසා වැඩ කල නොහැකිය. යුද කලාපයෙන් මාරුවක් ලබා ගන්නා විධියක් සොයා බලන ලෙස ඔහු ජීවත් වන සිටින සිය පුතාගෙන් ඉල්ලා සිටී.

දරුනු කොන්දේසි සහ දුෂ්පරිහරනය හේතු කොට ගෙන දහස් ගනන් සොල්දාදුවෝ හමුදාව හැර ගොස් ඇත. 2007 පෙබරවාරියේ දී හමුදාවට බැඳුනු 22 හැවිරිදි තරුන සොල්දාදුවෙක් හමුදාවෙන් පැන ගොස් ඇත්තේ සිය විවාහය සඳහා නිවාඩු අනුමත කිරීම ඔහුගේ නිලධාරීන් ප්‍රතික්ෂේප කිරීම නිසාය.

සැප්තැම්බර් 14 දා අලුයම මිලිටරි පොලීසිය ඔහුගේ නිවසට කඩා වැදී ඔහු අත් අඩංගුවට ගෙන බූස්ස රැඳවුම් කඳවුරේ රැඳවීය. ඔහුගේ බිරිඳ ඔහු හමුවීමට ගිය විට ඇයට ඔහු හා කතා කිරීමට දුන්නේ මිනිත්තු හතරක් පමනි. සිවු මස් ගැබිනියක වන ඇයට ජීවත් වීමට කිසිදු මගක් නැති නිසා දැන් සිය සොහොයුරා සමග කුරුනෑගල වාසය කරයි. එය එක කාමරයක්, පිලක් හා කුස්සියක් සහිත කුඩා නිවසකි.

ඇයගේ ස්වාමි පුරුෂයා, හමුදාව හැර ගිය තවත් 120ක් සමග, දැන් රඳවා ගෙන සිටින්නේ කොලඹ සිට කිලෝමීටර් 75ක් දුරින් පිහිටි කුරුවිට කඳවුරේ ය. සිය පියාට කතා කිරීමට ඔහුට හැකි වූ අතර හමුදාවට නොබැඳෙන ලෙස සිය ඥාති සොහොයුරාට කියන ලෙස ඔහු පියාට පැවසීය. අන් බොහෝ අය මෙන්ම ඔහුගේ පවුල ද ඉතා දුප්පත් ය. ඔහුගේ මව ඔහුගෙන් වියෝවී ඇත්තේ ඔහු කුඩා දරුවකුව සිටිය දී ය. ඔහුගේ පියාට එතරම් වැඩ ලැබුනේ නැත. හතර වන ශ්‍රේනියෙන් පසුව පාසල හැර ගිය ඔහු පසුව හමුදාවට බැඳුනි.



© www.wsws.org